(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 1(1).]

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2010 මැයි මස 21 වැනි සිකුරාද**

**2010 ජූනි මස 08 වැනි අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0085/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලුනාව සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශවාසීන් මුහුණ පෑ ගැටළු පිළිබඳව සොයා බැලීම සඳහා "සඳසිරි වික්‍රමආරච්චි ඒක පුද්ගල කමිටුව" නමින් කමිටුවක් පත්කල දිනය කවරේද;

(ii) එහි වාර්තාව ඉදිරිපත් කළ දිනය කවදාද;

(iii) උක්ත කමිටුව විසින් ඉදිරිපත් කළ වාර්තාවේ සාරාංශය කවරේද;

(iv) අදාළ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලීම් කරන ලද අවස්ථා තිබේද;

(v) මෙතෙක් එම වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0088/'10

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) නැගෙනහිර පළාතේ නීතිමය අවසරයක් නොමැතිව ආයුධ දරන පුද්ගලයින් සිටින්නේද;

(ii) සිවිල් ආරක්ෂක බලකාය, පොලිසිය හා ත්‍රිවිධ හමුදාව හැර වෙනත් අයට ආයුධ දැරීමට අවසර දී තිබේද;

(iii) එසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0056/10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තංගල්ල අධ්‍යාපන කළාපයට අයත් අඟුණුකොළපැලැස්ස කොට්ඨාස අධ්‍යාපන කාර්යාලයේ අධීක්ෂණයට ලක්වන දහඅමුණ සහ හුන්නකුඹුර යන ප්‍රාථමික විද්‍යාල වසර 03 ක කාලයක සිට වසා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම පාසල් දෙක පවත්වාගෙන යාම සඳහා ඉදිකරන ලද ගොඩනැගිලිවල වර්තමාන තත්වය කවරේද;

(ii) එම පාසල් ඉදිකිරීම් සඳහා වැය කරන ලද මුදලේ වර්තමාන වටිනාකම කොපමණද;

(iii) එම පාසල් ගොඩනැගිලි විනාශයට පත්වුවහොත් එම පාඩුව දරන්නේ කවුරුන් විසින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගොඩනැගිලි වෙනත් කාර්යයක් සඳහා භාවිත කිරීමට එතුමා කටයුතු කරන්නේද;

(ii) එම ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කොට ප්‍රයෝජනයට නොගන්නේ නම්, වෙනත් ආයතනයන්හි ප්‍රයෝජනය සඳහා ගොඩනැගිලි සහ භූමිය නිදහස් කිරීමට ඔබතුමා එකඟ වන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0057/10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසරක කාලයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරාක්‍රමපුර ග්‍රාම නිලධාරී වසමේ කු.ග. 03 ඇල්ලගල පිවිසුම මාර්ගයේ මීටර් 200 මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, ඉරිතැලී, අබලන් වී ඇති බැව් එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතන වලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම මාර්ගය ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0051/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගෘහස්ත හිංසන පනත යටතේ ලබාදුන් අතුරු නියෝග, අවසන් නියෝග බවට පත්කරන තුරු හෝ ඉවත් කරන තුරු වලංගුව පැවතිය හැකි උපරිම කාලසීමාව කොපමණද;

(ii) මෙම අවශ්‍යතාව නොසලකා හැර සිටීමට නීතියට අනුව ඉඩකඩ තිබේද;

(iii) මෙම අවශ්‍යතාවයට අනුව කටයුතු නොකළ අවස්ථා පසුගිය වසර දෙකක කාලය තුළ ඇතිවී තිබේද;

(iv) එවැනි අවස්ථා ඇතිවී තිබේනම්, ඒ සඳහා යොදා ගත හැකි පිළියම් කවරේද;

(v) මෙම නීතියට වඩා හොඳින් අනුගතවීම ප්‍රවර්ධනය කිරීම සඳහා මේ ක්‍රියාදාමයට සම්බන්ධ වන ඕනෑම අධිකරණ නිලධාරීන් පිරිසක් සඳහා අවශ්‍යවන පුහුණු වැඩසටහන් පැවැත්වීමට අදාළ පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0052/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සරණාගතයන් පිලිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා (UNHCR) විසින් කරන ලද පැවැරුමක් මත "කන්ට්‍රි ඔෆ් ඔරිජින් රිසච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් (CORI)" නම් සංවිධානයක් විසින් 2010 අප්‍රේල් මාසය තුල දී ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකාවට අදාළ වාර්තාවක් ගැන එතුමා දන්නේද?

(ආ) (i) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජික රටවල් එවැනි රටවල් පිළිබඳ වාර්තා සම්බන්ධයෙන් දැනුවත්කිරීම සහ එම වාර්තාවල අඩංගු කරුණු සඳහා දායකත්වය සැපැයීමට එම රටවල් වලට හැකිවීම සහතික කිරීම පිණිස පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) මෙම පවරන ලද කාර්යය සඳහා "කන්ට්‍රි ඔෆ් ඔරිජින් රිසච් ඇන්ඩ් ඉන්ෆොමේෂන් (CORI)" යන සංවිධානය තෝරා ගත් ක්‍රමය පිළිබඳ විස්තරයක්, පර්යේෂණය සඳහා සහභාගී වූ සේවක මඩුල්ල සහ ඒ සඳහා යොදාගත් පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ තොරතුරු සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා (UNHCR) වෙතින් ලබා ගැනීමට එතුමාට හැකියාව තිබේද; සහ

(iii) මෙම කාර්යය සඳහා වැයවන වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වාර්තාවේ කිසියම් සාවද්‍ය කරුණු ඇත්නම් ඒවා නිවැරදි කරන බව සහතික කිරීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0054/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) උතුරු පළාතේ භූමි ප්‍රමාණයෙන් 35% පමණ වූ වලිකාමම් උතුරු ප්‍රදේශය අධි ආරක්ෂිත කළාපයක් ලෙස ප්‍රකාශයට පත් කළ බව එතුමා දන්නෙහිද ?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රකාශයට පත් කිරීම සිදු කළ දිනය කවරේද; සහ

(ii) එවැනි ප්‍රකාශයට පත් කිරීමක් මෙම පාර්ලිමේන්තුවෙන් අනුමත කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0108/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ප්‍රමුඛ බැංකුවේ මුදල් තැන්පත් කළ පුද්ගලයින්ගේ නම් කවරේද;

(ii) ඔවුන් විසින් තැන්පත් කරන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එම මුදල් ආපසු ලබාදීම සම්බන්ධයෙන් මහ බැංකුව විසින් ලබා දී ඇති නියෝගයන් සහ මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) මෙම තැන්පත්කරුවන් අතුරින් රුපියල් ලක්ෂය බැගින් ආපසු ලැබුණු තැන්පත්කරුවන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) වයස අවුරුදු 60 ඉක්මවූ තැන්පත්කරුවන් වෙත ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) එසේ මුදල් ලබා දුන් අයගේ සංඛ්‍යාව කොපමණද ;

(iii) එක් එක් තැන්පත්කරුවෙකුට ආපසු ලබා දුන් මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0111/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) 2004 සිට 2010 මාර්තු 31 දක්වා එක් එක් වර්ෂයේ අයවැය පරතරය රුපියල් මිලියනවලින් වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) එම කාල සීමාව තුළ අයවැය පරතරයන් පියවා ගැනීමට දේශීය හා විදේශීය වශයෙන් ලබාගත් ණය ප්‍රමාණයන් පිළිබඳ විස්තරයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම ණය ප්‍රමාණය රුපියල්වලින් කොපමණද;

(ii) එම ණය ගෙවීමට ගතවන සම්පූර්ණ කාලය කොපමණද;

(iii) ඒ අනුව එක් එක් වර්ෂය තුළ ආපසු ගෙවිය යුතු මුදල රුපියල්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0083/'10

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) ගැමිදිරිය මුළු ව්‍යාපෘතින් සඳහා මේ වන විට වැයකර ඇති මුළු මුදල කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම මුදල් වලින්,

(i) නිලධාරී වැටුප් හා දීමනා;

(ii) පුහුණු පාඨමාලා හා වැඩමුළු;

(iii) විදේශීය සංචාර;

(iv) වාහන මිළ දී ගැනීම්/කුලියට ගැනීම්;

සඳහා වැය කර ඇති මුදල කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම ව්‍යාපෘතින් සඳහා මේ වන විට වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0099/'10

ගරු එම්. ජෝශප් මයිකල් පෙරේරා මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුල 2004 වර්ෂයේ සිට 2007 වර්ෂය දක්වා සෑම වර්ෂයකම ජූනි මස 30 වැනි දිනට හිමිකම් ලබමින් සිටි සමෘද්ධිලාභීන් සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එසේ හිමිකම් ලද අයට ගෙවනලද මුදල් ප්‍රමාණයන්, ඔවුන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) 2004, 2005, 2006 සහ 2007 වර්ෂවලදී සමෘද්ධිලාභීන්ට ගෙවන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වර්ෂ තුල සමෘද්ධිලාභීන් වශයෙන් සිට පසුව ඉවත් කරන ලද අයගේ සංඛ්‍යාව, නම් සහ ලිපිනයන් කවරේද;

(ii) එසේ ඉවත් කරන ලද්දේ කවර පදනමක් යටතේද;

(iii) අලුතින් එක් වූ සමෘද්ධිලාභීන් සිටීනම්, එම අයට ගෙවූ මුදල් ප්‍රමාණය සහ ඔවුන්ගේ ලිපිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0113/'10

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ, අම්පාර මැතිවරණ කොට්ඨාසය තුළ ජාතික ජලසම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇති,

(i) ප්‍රධාන පානීය ජල සම්පාදන යෝජනා ක්‍රම කවරේද;

(ii) එම එක් එක් ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) ඒවා මගින් පානීය ජලය සපයන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ජලය ලබා දී ඇත්තේ කවදා සිටද:

(v) එම ජල යෝජනා ක්‍රම මගින් පානීය ජලය ලබා දී නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(vi) ඒවාට පානීය ජලය ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අම්පාර නගරයට ජලය බෙදා හරින ජල ටැංකියේ අලුත්වැඩියා කටයුතු නිමවන තෙක් අම්පාර නගරයේ ජල සැපයුම සම්බන්ධයෙන් තාවකාලිකව ගන්නා පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සහ 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උප වගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2010 පෙබරවාරි මස 24 දිනැති අංක 1642/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— දුම්කොළ බදු පනත යටතේ නියෝග ,— 1999 අංක 8 දරන දුම්කොළ බදු පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලදුව, 2009 ජුලි 17 දිනැති 1610/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලැබූ, සිගරට්, සුරුට්ටු, බීඩි හෝ පයිප්ප දුම්කොළ සඳහා වූ අමු ද්‍රව්‍ය හෝ නිමි භාණ්ඩ නිෂ්පාදනය කිරීම, ගබඩා කිරීම, ආනයනය කිරීම හෝ අපනයන කිරීම සම්බන්ධයෙන් වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් පනවන ලද නියෝග, එම නියෝගයන්හි අංක 1 සිට 19 දක්වා වූ ඡේද හා එයට අදාළ වන්නා වූ සියලු උපලේඛන ඉවත් කර පනවන ලදුව, 2009 ඔක්තෝබර් 26 දිනැති අංක 1625/1 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ රීති ,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතෙහි 32 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින්, 1985 අගෝස්තු මස 14 දිනැති අංක 362/6ඒ දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද, අංක 744 දරන සුරාබදු නිවේදනයෙහි සඳහන් රීති පරිච්ඡින්න කරමින් පනවන ලදුව, 2010 පෙබරවාරි 12 දිනැති අංක 1640/30 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අංක 912 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමා විසින් 2009 දෙසැම්බර් 30 දිනැති 1634/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග එකී නියමයන්ට උපලේඛනයන්හි දැක්වෙන ද්‍රවීකරණය කල පැට්‍රෝලියම් වායු යන අයිතමය ඉවත්කර පනවන ලදුව, 2010 මාර්තු 01 දිනැති අංක 1643/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 26 වැනි වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් 2009 මාර්තු 31 දිනැති අංක 1595/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවල I, II, හා III වැනි උපලේඛන ඉවත්කර පනවන ලදුව, 2010 ජනවාරි 01 දිනැති අංක 1634/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝග (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සහ 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 26 වැනි වගන්තිය යටතේ, ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් 2005 මාර්තු 31 වැනි දින අංක 1386/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගවල 9 වැනි නියෝගය ඉවත් කර පනවන ලදුව, 2009 සැප්තැම්බර් 22 දිනැති අංක 1620/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2010 පෙබරවාරි 09 දිනැති අංක 1640/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ, විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ගරු ජනාධිපතිතුමා විසින් සාදන ලදුව, 2010 මාර්තු 19 දිනැති අංක 1645/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය පළ කරනු ලැබ, 2010.05.18 වැනි දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතුය.**

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

## (2010 ජූනි මස 08 වැනි අඟහරුවාදා)

104/'10

ගරු අජිත් කුමාර මහතා,— ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ලුණුගම්වෙහෙර ජල යෝජනා ක්‍රමයෙන් නළ ජලය සපයනු ලබන මුළු පාරිභෝගික සංඛ්‍යාව, ග්‍රාම නිලධාරී කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් එක් ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නළ ජලය සපයනු ලබන රජයේ පොදු ස්ථාන කවරේද;

(iii) දිනකට සපයනු ලබන මුළු ජල ලීටර් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) දිනක් තුළ අඛණ්ඩ ජල සැපයුමක් ලබාදෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අඛණ්ඩව ජලය ලබා නොදෙන, කාල සටහනකට අනුව ජලය ලබාදෙන ආකාරය පියවරෙන් පියවර, එක් එක් කොට්ඨාසයට අනුව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) (i) දින දෙකකට වරක් හෝ ජලය නොලැබෙන පාරිභෝගිකයන්ට බවුසර් මගින් ජල සැපයුමක් ලබාදීමට නොහැකි මන්ද;

(ii) ජල සම්බන්ධතා ලබාදී, එහෙත් ජලය නොලැබෙන පාරිභෝගිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) වෙහෙරගල ජලාශයෙන් ලුණුගම්වෙහෙරට මුදාහැරෙන ජලය උපයෝගී කරගෙන අඛණ්ඩ ජල සැපයුමක් ලබාදිමට හැකිද;

(iv) ඒ කවර කාලසීමාවක් තුළදී ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

105/'10

ගරු අජිත් කුමාර මහතා,— තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටි තැපැල් කාර්යාල හා උප, නියෝජිත හා ග්‍රාමීය වශයෙන් වූ තැපැල් කාර්යාල සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතුරින් ලිපි බෙදන කාර්යාල කවරේද;

(iii) ඉහත ඒ ඒ තැපැල් කාර්යාලය මගින් සේවය සපයන භූමි ප්‍රදේශය හා ජන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් කාර්යාලය මගින් පසුගිය වසර 5 තුළ වාර්ෂිකව උපයා ගෙන ඇති ඒකක ප්‍රමාණය කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් තැපැල් කාර්යාල බල ප්‍රදේශ සඳහා ඇති කලාප සංඛ්‍යාව, නියමිත තැපැල්කරුවන් හා විදුලි පණිවුඩකරුවන් සංඛ්‍යාව සහ 2009.06.30 වැනි දිනට එම තනතුරුවල පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(ii) පුරප්පාඩු පවතින්නේ කවදා සිටද;

(iii) අවසන්වරට කලාප ප්‍රතිශෝධනය කරන ලද්දේ කවදාද;

(iv) ඉහත ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ තැපැල් පහසුකම් සලසා නොමැති ග්‍රාම නිලධාරී කොට්ඨාස හා ගම්මාන කවරේද;

(v) තැපැල් පහසුකම් සලසනු ලබන්නේ කවර කාල සීමාවක් තුළද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූනි මස 09 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0018/'10

ගරු රවී කරුණානායක මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) 2006 සිට 2009 අවසානය දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජය මගින් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාසලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iii) එම නිවාස ලබා දී ඇත්තේ කවර පදනමකින්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිවාස ණය ලබා දී ඇති අයගෙන් මේ වන විට ණය ගෙවීමට ඉතිරිව ඇති අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(ii) ඔවුන්ට ගෙවීමට ඇති හිඟ ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0022/'10

ගරු රවී කරුණානායක මහතා,— ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසීමට,—

(අ) (i) "වැඩිහිටියන්ට පමණයි" යන චිත්‍රපටි සම්බන්ධ වර්තමාන තත්වය සහ ඒ හා සම්බන්ධ වර්තමාන නීතිමය තත්වය කුමක්ද;

(ii) ප්‍රසිද්ධ රඟුම් පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) දැනට එම මණ්ඩලය මගින් පරීක්‍ෂාවට ලක් කරමින් පවතින චිත්‍රපටි හෝ ටෙලි නාට්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) විදේශීය චිත්‍රපටි සහ නිවාසවලට සෘජුවම ලබා ගන්නා රූපවාහිනී පහසුකම් සඳහා ද මෙම තත්ත්වය බලපවත්වන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0090/'10

ගරු අජිත් කුමාර මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ජංගම දුරකථන සඳහා පරිසර සංරක්ෂණ බද්දක් පනවා තිබේද;

(ii) එසේ නම්, කෙදිනක සිට මෙම බදු අයකිරීම ආරම්භ කරන ලද්දේද;

(iii) 2010 වර්ෂයේ මෙම බද්ද හේතුවෙන් කොපමණ මුදලක් අයකර ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ බදු අය කළේ නම්, කොපමණ මුදලක් මහා භාණ්ඩාගාරයට යවා තිබේද;

(v) බදු මුදලින් කොපමණ ප්‍රමාණයක් ජංගම දුරකථන හේතුවෙන් හානිවන පරිසරය සංරක්ෂණය කිරීමට යොදවා තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ජංගම දුරකථන භාවිත කර ඉවත දමන බැටරි කොපමණ සංඛ්‍යාවක් පරිසරයට හානියක් නොවන පරිදි 2009 වර්ෂයේදී ඉවත් කරන ලද්දේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0100/'10

ගරු අජිත් කුමාර මහතා,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට, —

(අ) (i) මහින්ද චින්තන ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් පරිදි උපතේ සිට වසර 05 දක්වා දරුවන්ට කිරි මිලදී ගැනීම සඳහා මසකට රු. 200.00 බැගින් ලබාදීමට කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, එම දීමනාව ලබාදී ඇති දරුවන් සංඛ්‍යාව දිස්ත්‍රික් මට්ටමින් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අදාළ දීමනාව දිවයිනේ වසර 05ට අඩු සියළුම දරුවන් සඳහා ලබාදීමට පියවර ගන්නෙහිද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0058/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 06 ට පෙර තාර දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, ඕකේවෙලප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මොරකන්දගොඩ ග්‍රාම නිලධාරී වසමේ, මොරකන්දගොඩ පන්සල මාර්ගයේ මීටර්100 හි මේ වන විට තාර ගැලවී ගොස්, ගමන් කිරීමට නොහැකි තත්වයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කල බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතන වලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම මාර්ගය ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0059/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසර 02 ක කාලයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මානජ්ජාව ග්‍රාම නිලධාරී වසමේ, ලයිම හන්දියේ සිට මානජ්ජාව දක්වා මාර්ගයේ කි.මී. 01 ක දුර මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, තැනින් තැන වලවල් සෑදී, ගමන් කිරීමට නොහැකි තත්වයක ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කල බවට කාර්මික නිළධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය ඉදිකිරීම් සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතන වලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම මාර්ගය ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0060/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) හම්බන්තොට දිස්ත්‍රික්කයේ, තිස්සමහාරාම බල ප්‍රදේශයට අයත් තිස්සපුර හා රන්දුනු වත්ත ග්‍රාම නිලධාරී වසම් සහ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වැලිගත්ත, රඹුක්වැව, කිර්තිපුර යන ග්‍රාම නිලධාරී වසම් හි වල් අලි උවදුර නිසා වගා, නිවාස හා ජීවිත හානි සිදුවන බව එතුමා දන්නෙහිද?

(ආ) සිදු වන වගා හානි නිසා ගොවීන්ගේ ජීවින රටාව ගෙන යාමට නොහැකි තත්වයක් උද්ගත වී ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) පසුගිය කාලය තුළ වල් අලින්ගෙන් ජීවිත හානි සිදුවූ බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) නිවාස, දේපල හා ජීවිත හානි සිදුවීම පිළිබඳව මෙතෙක් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද;

(ii) මෙම උවදුරට ස්ථිරසාර විසඳුමක් ලෙස විදුලි වැටක් ඉදිකිරීම සහ එම විදුලි වැට දීර්ඝ කාලීනව නඩත්තු කිරීමට ක්ෂණිකව පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0053/'10

ගරු රාජීව විජේසිංහ මහතා, — මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට, —

(අ) (i) රාජ්‍ය නොවන සංවිධානවලට සහ පාර්ලිමේන්තු පනතකින් සංස්ථාගත කර ඇති සමාජ සේවා කටයුතු වල යෙදෙන ආයතන වලට ලැබෙන විදේශ අරමුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද;

(ii) සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ලියාපදිංචි වී ඇති සමාජ සේවා හෝ පර්යේෂණ හෝ උපදේශන කටයුතු වල යෙදෙන සමාගම් වලට ලැබෙන විදේශ මුදල් අධීක්ෂණය කිරීම සඳහා පවතින යාන්ත්‍රණයන් කවරේද; සහ

(iii) මෙම සමාගම් නීතියෙන් නියමකර ඇති පරිදි තම ලැබීම් ඉදිරිපත් කරන්නේද, බදු ලිපිගොනු පවත්වාගෙන යන්නේද සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් සහ මෙවන් සමාගම්වලට ලැබී තිබිය හැකි ප්‍රදානයන් මත බදු ගෙවීම කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 1999 සහ 2010 අතර වර්ෂ 2010 ඇතුළත් කාලසීමාව තුළ ජනවාර්ගික අධ්‍යයනය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානයට බාහිර මූලාශ්‍ර වලින් ලැබුණ අරමුදල් සහ එම අරමුදල් භාවිතා කළ කාරණා කවරේද;

(ii) මෙම අරමුදල් ලබාගත් හේතු විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අනුමත කළේද;

(iii) මෙම අරමුදල් භාවිතා කිරීම ආණ්ඩුවේ කිසියම් නියෝජිතායතනයක් මගින් අධීක්ෂණය කළේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0106/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) ඇහැලියගොඩ අධ්‍යාපන කළාපයේ ළමයින් 100කට වඩා අඩු සංඛ්‍යාවක් අධ්‍යාපනය ලබන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) 2008 සහ 2009 වසරවලදී මෙම එක් එක් පාසලෙහි සාමාන්‍ය පෙළ සහ පහ වසර ශිෂ්‍යත්ව විභාගයන්හි ප්‍රතිඵල කවරේද;

(iii) මෙම පාසැල් වලට අවශ්‍ය තරමට ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් සිටින්නේද;

(iv) ගුරුවරුන් නොපැමිණෙන අවස්ථාවලදී මෙම පාසල් වල ශිෂ්‍යයන් ඵලදායී කාර්යයන්හි නිරත වීම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඇහැලියගොඩ අධ්‍යාපන කළාපයේ,

(i) ප්‍රමාණවත් ගුරු සංඛ්‍යාවක් නොමැති විශාල පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) විද්‍යාව හෝ ගණිතය හෝ ඉංග්‍රීසි විෂයයන් සඳහා ප්‍රමාණවත් ගුරුවරු සංඛ්‍යාවක් නොමැති විශාල පාසල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ග්‍රාමීය ශිෂ්‍යයන්ට ප්‍රමාණවත් ගුරුවරුන් ලබා දීම තහවුරු කිරීම සඳහා පාසල් සහ ගුරු සේවක සංඛ්‍යාව ප්‍රතිසංවිධානය තුළින් කාර්යක්ෂම කිරීමට පළාත් අධ්‍යාපන අමාත්‍යවරුන් සඳහා එතුමා නිර්ණායක සකසන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0055/'10

ගරු ඒ. විනායගමූර්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) හමුදා මෙහෙයුම් නිසා 1990 වසරේදී වලිකාමම් උතුරු ප්‍රදේශයේ පුද්ගලයන් 100,000 පමණ අවතැන් වූ බවත්;

(ii) ඔවුන්ට තවමත් එම ප්‍රදේශයට ගොස් තම නිවාස වල නැවත පදිංචි වීමට අවසර ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඔවුන්ට එම ප්‍රදේශවලට ගොස් තම ඉඩම් වල පදිංචි වීමට අවසර ලබා දෙන්නේ කවදාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0112/'10

ගරු දයාසිරි ජයසේකර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) උතුරු නැගෙනහිර යුද්ධයෙන් පසු දැනට පුද්ගලයින් රඳවාගෙන සිටින අනාථ කඳවුරු පිහිටා ඇති ස්ථාන කවරේද;

(ii) එසේ රඳවාගෙන සිටින පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) එල්.ටී.ටී.ඊ. සැකකරුවන් ලෙස අත්අඩංගුවට ගෙන සිටින පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් කඳවුර තුළ සිටින සැකකරුවන් සංඛ්‍යාව වෙන වෙනම කොපමණද;

(iii) ඔවුන්ට ලබාදෙන පුහුණුවීම් කවරේද;

(iv) ඔවුන්ගේ අනාගත සුභසාධනය සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0114/'10

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දිගාමඩුල්ල දිස්ත්‍රික්කයේ අම්පාර මැතිවරණ කොට්ඨාසය තුළ,

(i) ජාතික ජල සම්පාදන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කර ඇති පානීය ප්‍රජා ජල යෝජනා ක්‍රම කවරේද;

(ii) එම එක් එක් ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ දිනයන් කවරේද;

(iii) ඒවා මඟින් පානීය ජලය සපයන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(iv) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට ජලය ලබා දී ඇත්තේ කවදා සිටද:

(v) ප්‍රජා ජල සම්පාදන ව්‍යාපෘති ලබා දිය හැකි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස කවරේද;

(vi) එම ව්‍යාපෘති ලබා දීමට කටයුතු කරන්නේ කවදාද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0115/'10

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, එක් එක් ග්‍රාම නිලධාරී වසම තුළ,

(i) පදිංචි පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉඩම් දීමනා පත්‍ර ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට ඉඩම් දීමනා පත්‍ර ලබා දීමට යෝජිත, ලිපිගොනු සකස් කොට ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න වෙන් වෙන් වශයෙන්, එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම දීමනා පත්‍ර ලබා දීමට කොපමණ කාලයක් ගතවන්නේද;

(ii) එම කටයුතු කඩිනම් කිරීම සම්බන්ධයෙන් එතුමා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

( ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජුනි මස 10 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0027/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 15 සඳහා,

(i) වෙළඳ පොළ අගය මත ඒක පුද්ගල පාරිභෝජනය;

(ii) භාණ්ඩ හා සේවා ආනයනය;

(iii) නැව් ගාස්තු රහිතව වෙළඳ පොල අගය මත භාණ්ඩ අපනයනය;

(iv) වෙළඳ පොල අගය මත දළ ජාතික නිෂ්පාදිතය සහ මිල ස්ථායීතාවය වෙන් වෙන් වශයෙන්;

(v) ගෙවුම් ශේෂයේ හිඟය හෝ අතිරික්තය;

(vi) උද්ධමනයට පෙර සහ පසු මිල ගණන් වැඩි වීම

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

0028/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) පසුගිය වර්ෂ දහයක කාලය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ලබා ගත් ලාභය;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් පවත්වාගෙන යනු ලබන දේශීය හා විදේශීය සංචිත ප්‍රමාණය; සහ

(iii) මෙම සංචිත වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ලබා ගන්නා ආදායම;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ හත සඳහා ජූනි 30 වැනි දිනට සහ දෙසැම්බර් 31 වැනි දිනට, රාජ්‍ය මුදල් ඌනතාවය මත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රජය වෙත ලබා දී ඇති මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0029/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 සඳහා වෙන් වෙන් වශයෙන්,

(i) ජාතික ශ්‍රම බලකාය;

(ii) රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ ශ්‍රම බලකායන් වෙන් වෙන් වශයෙන්;

(iii) හමුදා සේවයේ, පොලිස් සේවයේ, උපකාරක සේවාවන් සහ වෙනත් සේවාවන් වල නියුක්ත රාජ්‍ය සේවක ප්‍රමාණය; සහ

(iv) ඉහත (i) සහ (ii) සේවාවන්වල වැටුප් ගෙවීම සඳහා දරන පිරිවැය

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මීළඟ වර්ෂ 15ක් සඳහා ඉහත (අ)(i) සහ (අ)(ii) යන සේවාවන්වලට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා දැරිය යුතු පිරිවැය; සහ

(ii) ඉහත අංක (අ) (iii) යටතේ තාවකාලික හෝ ස්ථිර නොකරන ලද සේවක සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0101/'10

ගරු අජිත් කුමාර මහතා, — අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට, —

(අ) 2004 සිට 2010 වර්ෂය දක්වා වූ කාල සීමාවේදී, එක් එක් වර්ෂයේදී සමස්ත ශ්‍රී ලංකාව තුළ දිස්ත්‍රික් මට්ටමින්, වෙන් වෙන් වශයෙන්,

(i) ක්‍රියාත්මක වූ පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) වසා දමන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;

(iii) ආරම්භ කරන ලද පාසල්, පිරිවෙන් සහ උපකෘත පාසල් සංඛ්‍යාව සහ ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2004 සිට 2010 දක්වා කාලසීමාවේදී ශ්‍රී ලංකාව තුළ පාසල් වසා දැමීමට හේතුවූ කරුණු මොනවාද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0061/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසර 03 කට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කොන්වැලැන ග්‍රාම නිලධාරි වසමේ ගහ වැලැන මාර්ගයේ මීටර් 200 හි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතැලී, අබලන්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය ඉදිකිරීම සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතන වලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම මාර්ගය ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0062/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසරකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, සූරියවැව නගරය ග්‍රාම නිලධාරි වසමේ; සූරියවැව නගරය, මුවන්පැලැස්ස, වැවේගම මාර්ගයේ කි.මී. 02 හි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතලා, ගැලවී ගොස්, වලවල් සෑදී, අබලන් තත්වයකට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය ඉදිකිරීම් සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතන වලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම මාර්ගය ඉදිකිරීම පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0063/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වසරකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බැද්දෙවැව ග්‍රාම නිලධාරි වසමේ පදලංගල සිට 250 මාර්ගයේ කි.මී. 1.5 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ගැලවී අබලන් වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

107/'10

ගරු රාජීව විජේසිංහ මහතා,— පුනරුත්ථාපන සහ බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයා විසින් කරන ලද පැවරුමක් මත "කන්ට්‍රි ඔෆ් ඔරිජින් රිසර්ච් ඇන්ඩ් ඉන්ෆොමේෂන්" නම් සංවිධානයක් විසින් ශ්‍රී ලංකාවේ තත්වය පිළිබඳ වාර්තාවක් 2010 අප්‍රේල් මාසය තුළ දී ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ බන්ධනාගාර සම්බන්ධව එම වාර්තාවේ සඳහන් කොට ඇති සංඛ්‍යාලේඛන නිවැරදිද;

(ii) බන්ධනාගාර පිළිබඳ වගකීමක් දැරූ කිසියම් අමාත්‍යාංශයක් විසින් ශ්‍රී ලංකාවේ බන්ධනාගාර තුළ පවත්නා තත්වය වැඩි දියුණු කිරීම සඳහා පසුගිය අවුරුදු විස්සක කාලය තුළ පිළියෙල කර ඇති නිර්දේශ කවරේද;

(iii) එවැනි නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද;

(iv) නොඑසේ නම්, එවැනි නිර්දේශයන් කඩිනමින් ක්‍රියාත්මක වන බවට සහතික කොට ඒ බව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට එතුමා පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# 2010 ජූනි මස 11 වැනි සිකුරාදා
# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0030/'10

ගරු රවී කරුණානායක මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මෙරටෙහි ලියාපදිංචි කර ඇති සමස්ථ මගී ප්‍රවාහන මෝටර් රථ, වෑන් රථ, ලොරි රථ, ත්‍රී රෝද රථ සහ බයිසිකල් සංඛ්‍යාව කොපමණද; සහ

(ii) ලියාපදිංචි කළ දිනයේ සිට
වසර 2 ට වඩා අඩු,
වසර 2 සිට 5 දක්වා,
වසර 5 සිට 10 දක්වා,
වසර 10 සිට 20 දක්වා, හා
වසර 20 ට වඩා වැඩි යන

කාණ්ඩ වලට අයත් වන, ඉහත සඳහන් වර්ග වලට අයත් වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආදායම් බලපත්‍ර මඟින් රජය හෝ පළාත් සභාව උපයාගත් මුදල් ප්‍රමාණය කොපමණ ද යන්න එතුමා සඳහන් කරන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0031/'10

ගරු රවී කරුණානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 10 සඳහා පොහොර සහනාධාරය ලබා දීම වෙනුවෙන් රජය විසින් දරන ලද වියදම වාර්ෂික පදනම මත කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පසුගිය වර්ෂ 4 සඳහා,

(i) පොහොර සහනාධාරය ලබා දෙන ලද කෘෂිකාර්මික කටයුතු මොනවාද;

(ii) පොහොර සහනාධාරය ලබා දෙන ලද දිස්ත්‍රික්ක සහ ප්‍රමාණයන් කොපමණද;

(iii) එම පොහොර ආනයනය කළ රටවල් මොනවාද;

(iv) එම ආනයන කටයුතු සිදු කරන ලද්දේ රජය විසින් ද, නැත්නම් පුද්ගලික අංශය විසින් ද; සහ

(v) එක් එක් පොහොර වර්ගය සඳහා ටොන් එකකට දරන ලද පිරිවැය සහ මුළු පිරිවැය කොපමණද?

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම පොහොර සහනාධාරය පොල්, රබර්, තේ සහ එළවලු ගොවීන් සඳහා ලබා නොදීමට හේතු කවරේද?

(ඈ) එය රජය මඟින් ලබා දෙන්නේ නම්, ඉහත සඳහන් වැවිලි වර්ග සඳහා දිස්ත්‍රික් වශයෙන් ලබා දිය යුතුව තිබුණු සහනාධාර ප්‍රමාණය කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0032/'10

ගරු රවී කරුණානායක මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) පසුගිය වර්ෂ 5 වෙනුවෙන් මාර්ග සංවර්ධනය සහ නඩත්තු කිරීම සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණය සහ සත්‍යවශයෙන් වියදම කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නඩත්තු කරන ලද ප්‍රධාන වැදගත් මාර්ග දහයක් සහ ඒ සඳහා වියදම් කරන ලද මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ඉදිකිරීමට නියමිත නව මහාමාර්ගවලට සහ අධිවේගී මාර්ගවලට අදාළව,

(i) ඒවායේ නම් මොනවාද;

(ii) ඇස්තමේන්තු ගත වියදම කොපමණද;

(iii) ඒවා ආරම්භ කරන සහ නිමකරන දිනයන් මොනවාද;

(iv) අදාල ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ මිල ගණන්; සහ

(v) මුදල් සපයා ගැනීමේ මාර්ග සහ ණය පොළී අනුපාතිකය සමග සම්පූර්ණ පිරිවැය කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0064/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 05 ට පෙර තාර දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හත්පොරුව, අලිඔලුආර ග්‍රාම නිලධාරි වසමේ, අලිඔලුආර නුගේ අසල සිට හත්පොරුව දක්වා මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට තාර කුට්ටි වශයෙන් ගැලවී, ගමන් කිරීමට නොහැකි තත්වයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතුවලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0065/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, දෙබොක්කාව දකුණ ග්‍රාම නිලධාරි වසමේ, වෙලේ ලිඳ මාර්ගයේ මීටර් 100 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ගැලවී, වලවල් සෑදී, අබලන් තත්වයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0066/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙබොක්කාව උතුර ග්‍රාම නිලධාරී වසමේ, කැරන්කොකුආර මාර්ගයේ මීටර් 200 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ගැලවී, වලවල් සෑදී අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2010 ජූනි මස 22 වැනි අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0033/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ වන විට අප රටෙහි සම්පූර්ණ තිරිඟු පරිභෝජනය කොපමණද;

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ප්‍රමාණය සහ ආනයනය කරන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) පසුගිය වසර 20ක කාලය තුළ තිරිඟු වල සිල්ලර මිල ගණන් වාර්ෂික පදනමින් කොපමණද;

(iv) පාරිභෝගිකයන් දරන බර අඩු කිරීම සඳහා තිරිඟු වලට යම් කිසි සහනාධාරයක් ලබා දෙන්නේද;

(v) එසේ සහනාධාර ලබා දෙන්නේ නම්, මේ වන විට ලබා දී තිබෙන ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ආනයනය කරන ලද හෝ දේශීය වශයෙන් නිෂ්පාදනය කරන තිරිඟු පාරිභෝගිකයන්ට ලැබෙන අවස්ථාව දක්වා වූ ක්‍රියාවලිය තුල මේ වන විට තිරිඟු මත පනවා ඇති සියලු බදු කවරේද යන්න එතුමා වෙන් වෙන් වශයෙන්, සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0034/'10

ගරු රවී කරුණානායක මහතා,— සමූපකාර සහ අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) (i) මේ දක්වා විවෘත කර තිබෙන "ලක් සතොස" වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා ආයෝජනය කර ඇති ප්‍රාග්ධනය කොපමණද;

(iii) ඒ සඳහා කිසිදු ප්‍රාග්ධනයක් නොයෙදවූයේ එම වෙළඳසැල් සඳහා අවශ්‍ය ඉඩකඩ කුලියට ගත්, මිලදී ගත් හෝ අත්පත් කර ගත් ආකාරය සහ ඒ සඳහා භාණ්ඩ මිලදී ගත් ආකාරය කවරේද;

(iv) මේ දක්වා "ලක් සතොස" හි සමස්ථ වෙළෙඳ පිරිවැටුම කවරේද; සහ

(v) මේ දක්වා එහි සම්පූර්ණ වෙළඳ පිරිවැය, මූල්‍ය පිරිවැය සහ ශුද්ධ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම සියලු වෙළඳසැල්වල සේවයේ නියුතු කාර්ය මණ්ඩල සහ පුද්ගලයන්ගේ සංඛ්‍යාව කොපමණද;

(ii) වැටුප් වශයෙන් ගෙවනු ලබන මුදල් ප්‍රමාණය සහ එක් පුද්ගලයකු සඳහා ගෙවන සාමාන්‍ය වැටුප කොපමණද

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය වසර 5 සඳහා එක් එක් වසර තුල වාර්ෂික ලාභය හෝ අලාභය කොපමණද යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0035/'10

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) වර්ෂ 2010 අප්‍රේල් 30 වැනි දිනට රජය මගින් ගෙවීමට නියමිත දේශීය හා විදේශීය ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව) කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2005 සිට 2009 දක්වා වර්ෂවලදී රජය මගින් ලබා ගන්නා ලද සම්පූර්ණ ණය මුදල් ප්‍රමාණය (භාණ්ඩාගාර බිල්පත් ද ඇතුළුව) ; සහ

(ii) ඉහත සඳහන් වර්ෂවලට අදාළව ණය වාරික හා පොළී වශයෙන් දේශීය හා විදේශීය ණය වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0067/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලාව ග්‍රාම නිලධාරි වසමේ, තලාව හංදිය, දඹරුල්ල මාර්ගයේ කි.මී. 01 ක දුර ප්‍රමාණයෙහි මේ වන විට කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත් එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0068/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා, — මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට වර්ෂයකට පෙර කොන්ක්‍රීට් දමා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගහවල, බිංකම, මැදආර ග්‍රාම නිලධාරි වසමේ, කරගහවල, මැදආර, හිංආර මාර්ගය කි.මී. 05 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී, අබලන් තත්වයක ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0069/'10

ගරු සජිත් ප්‍රේමදාස මහතා ,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,—

(අ) දැනට මාස 08 ට පෙර කොන්ක්‍රීට් අතුරා සකසන ලද හම්බන්තොට දිස්ත්‍රික්කයේ, කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වතුකන්ද ග්‍රාම නිලධාරි වසමේ, කොලොන්ගහහේන මාර්ගයේ මීටර් 300 ක දුර ප්‍රමාණයෙහි කොන්ක්‍රීට් ඉරිතලා, වලවල් සෑදී අබලන්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද;

(ii) ඉදිකිරීම් සඳහා මුදල් නිදහස් කිරීමේදී ප්‍රමිතීන්ට අනුව වැඩ නිම කළ බවට කාර්මික නිලධාරීන්ගේ නිර්දේශ ලබාගෙන තිබේද;

(iii) එම මාර්ගය සඳහා ගෙවීම් කටයුතු වලදී වෙනත් කුමන ආයතනවලින් නිර්දේශ ලබාගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් පැවැත්වීමටත්, එම මාර්ගය යථා තත්වයට පත් කිරීමටත් එතුමා කටයුතු කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 36/'10

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීම පිණිස වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

පාර්ලිමේන්තු සේවය, එහි සියලුම අංශවල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් පවත්වා ගත යුතු ස්වාධීන තත්ත්වය තවදුරටත් ශක්තිමත් කිරීමට නිර්දේශ ඉදිරිපත් කිරීමට අවශ්‍ය වී ඇති හෙයින්;

(අ) පාර්ලිමේන්තු සේවයේ ස්වාධීන තත්ත්වය ශක්තිමත් කිරීම; සහ

(ආ) කාරක සභාව විසින් අදාළ යැයි තීරණය කරනු ලබන අනෙකුත් කරුණු;

යනාදිය පිළිබඳව සොයාබලා පාර්ලිමේන්තුවට වාර්තා කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත්කළ යුතු යැයි මෙම සභාව යෝජනා සම්මත කරයි.

(2.) (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකතුමා විසින් නම් කරනු ලැබිය යුතු ය.

(ආ) ස්ථාවර නියෝග 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුනද, මෙම කාරක සභාව සාමාජිකයින් පස් (05) දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(3.) ඒ කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තකු කැඳවීමට ද, යම් ලේඛනයක් හෝ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට නියම කිරීමට ද, ඉහත සඳහන් කරුණු පූර්ණ ලෙස සලකා බැලීම පිණිස අවශ්‍ය යයි කාරක සභාව කල්පනා කරන ලිඛිත හෝ වාචික සියලු සාක්ෂි පාර්ලිමේන්තුවේ මහලේකම්වරයාගේ වත්මන් සහ හිටපු කාර්යමණ්ඩල සාමාජිකයන්ගෙන් හා කාර්ය මණ්ඩල සංවිධානවලින් ලබා ගැනීමට හා භාර ගැනීමට ද;

(ඇ) කාරක සභාව වෙත සහාය ලබා ගැනීම පිණිස අදාළ ක්ෂේත්‍රයන්හි විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවාවන් ලබා ගැනීමට; සහ

(ඈ) කලින් කලට අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට සහ පාර්ලිමේන්තුව අඩාලව කල් තබන ලද්දේ වුව ද, රැස්වීම් පවත්වාගෙන යෑමට ද ;

බලය තිබිය යුතු ය.

(4.) සියලුම කරුණු සැලකිල්ලට භාජනය කිරීමෙන් අනතුරුව, කාරක සභාව පත්කර මාස පහ (05) ක් ඇතුළත හෝ පාර්ලිමේන්තුවේ අභිමතය පරිදි නියම කරනු ලබන පසු දිනයක හෝ වාර්තාව ඉදිරිපත් කළ යුතු ය.